සමාජය හා ජීවන රටාව පසුබිම් කොටගෙන නවකතා කිහිපයක්ම රචනා කළ චිනුවා අචෙබෙ නමැති ලේඛකයාගේ එම නවකතාවල එන ඇතැම් සිදුවීම් මගින් ඊට සාධක සොයාගත හැකිය. තම දියණිය හිඳගෙන සිටින ඉරියව්ව වැරදි බව පෙන්වමින්, "ගෑනු ළමයෙක් වාඩි වෙන විදියට" වාඩි වෙන්නැයි ඇයට අවවාද කරන වැඩිහිටියන් ගැන ඇතැම් යෙදුම් එම කෘතීන්හි දක්නට ඇත. මේ අයුරින් බලන විට සිංහල සමාජයේ මෙන්ම පෙරදිග හා වෙනත් ඇතැම් සමාජවල ද යෞවන වියට පත් වන්නට සිටින ගැහැනු දරුවන් සම්බන්ධයෙන් කිසියම් විශේෂිත සදාචාරාත්මක හැසිරීම් රටාවක් නියම වී තිබූ ආකාරය පෙනේ.

මලයාසියානු සමාජය තුළ ඉස්ලාම් භක්තියට අනුව ගැහැනු ළමයකුගේ වයසේ සිට ඉහළට කාන්තා ජීවිතයේ විශේෂ අපේක්ෂාවන් පැවති හා තව දුරටත් පැවතෙන බව පෙනේ. මෙයින් ඇතැම් චාරිත්‍ර සෙසු මුස්ලිම් ජාතික සමාජයන්ට ද පොදුය. ගැහැනියක් නිරතුරුවම හිස වසාගෙන සිටිය යුතුය යන නියමය මෙයින් එකකි. චීනය, ජපානය වැනි සමාජවල කාන්තාවගේ සුන්දරත්වය ඇය ඇන්ද කිමොනො ඇඳුමෙන් මතු වීම එකලදී අපේක්ෂා කෙරුණ අතරම එම ඇඳුමෙන් ඇයගේ සිරුරේ වැඩි කොටසක් ආවරණය වී තිබීමෙන් ද කිසියම් ආකාරයක සුචරිතවත් බවක් අපේක්ෂා කෙරුණි යයි සිතන්නට ඉඩ ඇත. මෙයින් ඇතැම් චාරිත්‍ර සෙසු මුස්ලිම් ජාතික සමාජයන්ට ද පොදුය. ගැහැනියක් නිරතුරුවම හිස වසාගෙන සිටිය යුතුය යන නියමය මෙයින් එකකි. චීනය, ජපානය වැනි සමාජවල කාන්තාවගේ සුන්දරත්වය ඇය ඇන්ද කිමොනො ඇඳුමෙන් මතු වීම එකලදී අපේක්ෂා කෙරුණ අතරම එම ඇඳුමෙන් ඇයගේ සිරුරේ වැඩි කොටසක් ආවරණය වී තිබීමෙන් ද කිසියම් ආකාරයක සුචරිතවත් බවක් අපේක්ෂා කෙරුණි යයි සිතන්නට ඉඩ ඇත.

සිංහල සමාජය එදා මෙදාතුර දැරිය, ළදැරිය, යෞවනිය, තරුණිය, පතිනිය, මිත්තණිය යන භූමිකාවන්හිදී ගැහැනියගේ වෙනස හඳුනාගන්නටත් සමාජය තුළ ඒ ගැන නිරන්තර අවධානයක් යොමු වන්නටත් වගබලාගෙන ඇත. පිරිමි දරුවකුගේ වැඩිවිය පත් වීම සාමාන්‍ය සිදුවීමක් සේ සලකනු ලබන අතර ගැහැනු ළමයකු මල්වර වන අවස්ථාව විශේෂත්වයකින් සලකනු ලැබේ. මල්වර වී ඇතැයි සැලකෙන දැරිය වහාම පවුලේ සෙසු අයගෙන්, විශේෂයෙන්ම පිරිම පක්ෂයේ අයගේ ඇස නොගැටෙන සේ වෙන් කර තබනු ලබන අතර ජ්‍යොතිෂය අනුව කරුණු සොයා බලා ඇයගේ එම අවස්ථාවට අදාළ චාරිත්‍ර චාරිත්‍ර සිදු කිරීමට වැඩිහිටියෝ පියවර ගනිති. නක්ෂත්‍රානුකූලව තෝරාගත් සුබ මොහොතින් දැරිය නාවා හිස සිට සුදු වස්ත්‍රයකින් වසා ගෙට ඇතුල් කරවනු ලැබ ඉන් පසුව පහන් දල්වා කළ යුතු වෙනත් වතාවත් සිදු කරනු ලැබේ. දෙමාපිය වැඩිහිටියන්ට ගරු බුහුමන් දක්වන ඇයට ඔවුන්ගෙන් තෑගි බෝග ලැබීමට අමතරව කිරිබත් ප්‍රමුඛ කොටගත් විශේෂ ආහාරවලින් එකිනෙකාට සංග්‍රහ කරනු ලැබීමේ උත්සවාකාර සිදුවීම් ද මෙහිදී දක්නට ලැබේ. එකල ගැමි පරිසරයෙහි දැරියක් මල්වර වීම, 'කොටහළු' වීම නමින් හැඳින්වූ අතර එහිදී ඇය එම අවස්ථාවට පෙර ඇඳ සිටි ඇඳුම් පැලඳුම් හා රන් ආභරණ යනාදී සියල්ල හැර ලීම, ඉවත් කර ලීම යන අරුතෙන් මෙම යෙදුම යෙදුණු බව විශ්වාස කෙරේ. පැරණි සිංහල සමාජයේ මෙවන් කටයුතුවලදී රෙදි නැන්දා මුල් තැනක් ගනු ලැබූ අතර දැරිය ඇඳ පැලඳ සිටි සියලු දෑ ඇය නාවනු ලබන අවස්ථාවේදී ගලව ඉවත් කර රෙදි නැන්දාට ඒවා ලබා දීමේ සිරිතක් ද පැවතිණ. මේ අනුව, ඇතැම් ගැමි පවුල්වල මල්වර වීමට ආසන්නව සිටි දැරියන්ගේ කන්වල පැලඳ තිබූ රන් ආභරණ ආදිය ගලවා ඉවත් කර තැබූ අයුරුත් ඒ වෙනුවට, කන්වල සිදුරු නොවැසී තිබීම සඳහා ලාභ කර්ණාභරණ හෝ වෙනත් යමක් දමා තිබීම ද දක්නට ලැබිණ.

දැරියක ලෙස සිට මල්වර වීමේ අවස්ථාව පසු කොට යෞවනියක් බවට පත් වන ඇයට මල්වර මගුල විශේෂ සිදුවීමක් ලෙස සලකා උත්සව ආදිය පැවැත්වීමේ මනෝවිද්‍යාත්මකව වැදගත් වන කිසියම් අරුතක් ඇත. ගැමියන් විශ්වාස කළ පරිදි ඒ වන තෙක් නිදහසේ දුවපැන ඇවිදිමින් සිටි තමන් දැන් ජීවිතයේ වෙනස් හා වගකීම් සහිත තත්වයකට පත් වී ඇත යන්න මානසික වශයෙන් ඇයට දැනිය යුතු බවත්, ඒ සඳහා මෙවැනි විශේෂ සිරිත් විරිත්වලින් සැදි උත්සව අවස්ථාවක් පැවැත්විය යුතු බවත් මෙයින් ගම්‍ය වන බව කියවෙයි. බොහෝ විට වැඩිහිටි කාන්තාවක් ඇයට මෙම වෙනස පිළිබඳව කියා දෙනු ලබන අතර, පෙර පරිදි පිරිමි ළමයින් සමග නිදහස් ඇසුර ඇයට 'අකැප' බව ද පැහැදිලි කර දෙනු ඇත. වැඩිවිය පත් දැරියක් යෞවනියක වීමත් සමගම කවර මොහොතක හෝ ඇති විය හැකි ලිංගික එකතුවකින් ගැබ් ගැනීමේ ප්‍රවණතාව ඇති බැවින් විවාහ වන අවස්ථාව දක්වා ඇය එබඳු සම්බන්ධතාවලින් ආරක්ෂා කරගැනීමට එදා ගැමි සමාජය උත්සාහ දැරීය.

මෙකී අදහස් එලෙසම බලනොපෑ හා විශ්වාස නොකෙරුණ බටහිර සමාජයන්ට මෙවැනි දේවල අගයක් හෝ විශේෂත්වයක් නොතිබුණද ශ්‍රී ලාංකික සිංහල සමාජය එදා අකුරටම මෙන් පිළිපදින්නට උත්සාහ ගත් දේ ලෙස මේවා සැලකිය හැකිය. කරුණු මෙසේ වුවද වර්තමාන යුගයට එන විට මේ අතුරෙන් ඇතැම් විශ්වාස හා ඇවතැ‍ම් පැවතුම් සිංහල සමාජයෙන් ක්‍රමක්‍රමයෙන් ඉවත් වී ගොස් ඇති බව පෙනේ. නූතන ලෝකය බොහෝ අංශවලින් වෙනස් වී සංකීර්ණ වෙමින් පවතී. ශ්‍රී ලාංකික සිංහල සමාජය තුළ ද එම තත්වය දැකගත හැකිය. යෞවනියන් විරුද්ධ ලිංගිකයන් සමග සුහදතාව මෙන්ම නිදහස් ඇසුරක් ද පැවැත්වීමට නැඹුරු වන සේ අද සමාජය වෙනස් වී ඇත. පෙර මෙන් බාල දැරියකට හෝ යෞවනියකට ඇයගේ හැසිරීමෙහි විශේෂ සංවර බවක් තිබිය යුතුය යන බල කිරීම අද බොහෝ දුරට නාගරික සමාජයේ නොපවතින තත්වයකි.

යෞවන වියේ සිට තරුණ වයසට පත් වන කාන්තාව ඉන් අනතුරුව සිය විවාහය සමග අනාගතය ගැන සිතිය යුතැ‍ වෙයි. කෙසේ නමුදු මේ සම්බන්ධයෙන් ද සිංහල සමාජයේ එදා පැවති තත්වය අදට වඩා බෙහෙවින් වෙනස්ය. දියණියකගේ උපත මෙන්ම ඇයගේ තරුණ විය දක්වාම කාල සීමාව වැඩිහිටියන්ට බරක් ලෙස එදා සැලකැ‍ණි. ඇය සුචරිතවත් දියණියක ලෙස ආරක්ෂා කරගැනීම මෙන්ම යථා කාලයේදී සුදුසු විවාහයක් කර දීම ද මව්පියන් සතු වගකීමක් විය. පැරණි දඹදිව සමාජයේ පැවති තත්වය ද මෙයම වූ බවට දඹදෙණි යුගයේ රචිත සද්ධර්මරත්නාවලියෙහි සහ ඊට පාදක වූ පාලි ධම්මපදට්ඨකථා යන කෘතියෙහි එන ඇතැම් කරුණු ද සාක්ෂි දරයි. තම දරුවන් නිසි වයසට පැමිණි කල්හි, "සුදුසු තෙනින් සරණ ගෙන්වා පාවා දී වෙන් කළහ" යනුවෙන් සද්ධර්මරත්නාවලියෙහි යෙදී ඇති පාඨයට මූලාශ්‍රය වූ පාලි කථාවෙහි, "ඝරබන්ධනේන බන්ධිංසු" යනුවෙන් දැක්වෙනුයේ නිසි වයසට පැමිණි දරුවන් "ගිහිබැම්මෙන් බැන්දාහ" යන අරුත හඟවමිනි. මෙලෙසින් ගත් විට තරුණ වියට පත් වන පුතුන්ට ආවාහ කර දීම මෙන්ම තරුණ දියණියන් සුදුසු තරුණයන්ට විවාහ කර දීමේ වගකීම ද එදා පවුලේ දෙමාපිය වැඩිහිටියන් සතු විය.

වර්තමාන සිංහල සමාජය තුළ තරුණිය, දෙමාපියන් එම කටයුත්ත ගැන සිතන්නටත් පෙරම තමන්ට සුදුසු සහකරුවා සොයාගෙන හමාර වන තත්වයක් පවතී. අවසානයේදී, විවාහයකට එළඹීම සඳහා දෙමාපියන්ගේ අවසරය හා ආශිර්වාදය අපේක්ෂා කරන විට ඇතැම් දෙමව්පියන් වේදනාව මුසු ස්වරයකින් දරුවන්ට පවසනුයේ "ඔක්කොම ලෑස්ති කරගෙන ඉවර වෙලා අපෙන් අවසර ඉල්ලනවා" වැනි අදහස්ය. කෙසේ නමුදු සමාජය ශීඝ්‍ර ලෙස වෙනසට භාජන වෙමින් යද්දී, නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල වශයෙන් තම රැකියාවන්හි යෙදෙන අතරදී තමන්ට හමු වන තරුණයන් අතුරින් තම සිත්ගත් තරුණයා සමග විවාහ වන්නට තරුණියක් අදහස් කිරීමේ වරදක් අද දෙමාපියන් පවා නොසිතන්නට ඉඩ ඇති අවස්ථා බහුලය. අනතුරුව තරුණ දියණියන් තම විවාහ මංගල්‍යයට අදාළ බොහෝ දේ අදාළ තරුණයා සමග එක්ව තීරණය කොට ඒ අනුව මංගලෝත්සවය පැවැත්වීමත් දෙමාපිය වැඩිහිටියන් ඔවුන්ගෙන් ඉටු විය යුතු දේ ඉටු කිරීමත් අද සිදු වන ආකාරය දැකගත හැකිය.

මෙවැනි වෙනස්වීම් වර්තමාන සිංහල සමාජයේ, විශේෂයෙන්ම නාගරික සමාජය තැ‍ළ අද දක්නට ලැබෙන අතර සමාජය විසින් ද බොහෝ දුරට ඒවා සාමාන්‍ය දේ ලෙස සලකනු ලබන බව පෙනේ. කාන්තාවකගේ ජීවිතයේ වඩාත් කාර්යබහුල වූත් වගකීම් බහුල වූත් කාලය එළඹෙන්නේ මෙතැන් සිටය. වැඩිහිටි ආශිර්වාදය ද ඇතිව පතිනියක ලෙස කුලගෙට පිවිසෙන ඇය එතැන් පටන් අලුත්ම ජීවන රටාවකට හැඩ ගැසිය යුතු වන්නීය. දීග විවාහය සහ බින්න විවාහය යන විවාහ ක්‍රම

14 වන පිටට

